# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1604/7 - 2009 ජුනි 01 වැනි සඳුදා - 2009.06.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)



# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් කරන ලද නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමූපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමූපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීම

මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය පළාත් පාලන හා පළාත් පරිපාලන මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ප්‍රවාහන, ඉඩම්, සමූපකාර සංවර්ධන, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු, ආයෝජන සම්බන්ධීකරණ අමාත්‍ය සරත් ඒකනායක වන මා වෙත මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමූපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 10 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ දෙවන වගන්තියේ දෙවන සහ හතරවන උපවගන්ති මගින් පැවරී ඇති බලතල අනුව පහත අංක I වැනි තීරුවේ සඳහන් මධ්‍යම පළාත් සභාවේ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) වෙත III වැනි තීරුවේ සඳහන් බලතල II වැනි තීරුවේ සඳහන් දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරා දෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| ඩී. එම්. සෙනවිරත්න<br>ඩබ්. ජී. චන්ද්‍රරත්න<br>ඩබ්. එම්. සරත් ගල්ලැල්ල | 2008.12.03 | මධ්‍යම පළාත් සභාවේ 1990 සමූපකාර සමිති ප්‍රඥප්තියේ 3, 5, 6, 7, 8, 9, 33, 43, 43(අ), 44, 45, 46, 48, 52, 53, 54, 58, (2අ, 3, 4, 5 උපවගන්ති හැර) 59, 60අ, 66, 67, 68, 69, 74 සහ 75, රීති මාලාවේ 4, 11, 15, 16(ii) 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49 (12 ආ, ඇ, ඈ, ඊ. උපවගන්ති හැර) 51, 52, 53 යන රීති යටතේ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් සතු සියලු බලතල. |

සරත් ඒකනායක,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රමසම්පාදන,නීතිය හා සාමය පළාත් පාලන හා පළාත් පරිපාලන
මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ප්‍රවාහන,
ඉඩම්, සමූපකාර සංවර්ධන, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු,
ආයෝජන සම්බන්ධීකරණ අමාත්‍ය.

06-291

1A - PG 001039—435 (2009/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.